**මුලතිව් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 11 - 2024**

---

**1. විගණන මතය**

**1.1** මුලතිව් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 11ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** මුලතිව් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 11ට අදාළ 2024 වර්ෂයේ නිකුත් කර තිබුණ විගණන වාර්තා 11 සඳහාම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබූ අතර ඒ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 7ක පැවති සහනාධාර පොහොර මෙට්‍රික් ටොන් 221.10 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | විකිණීමෙන් පසු සිදු කරන ලද ගෙවීම හේතුවෙන් නොපෙන්වන ලදී. අදාළ මුදල ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල පෙන්වීමට පියවර ගෙන ඇත. | සහනාධාර පොහොර තොගයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ගොවිජන කාරක සභා 03කට අයත් ගොඩනැගිලි, රූපවාහිනී සහ කෘෂිකාර්මික උපකරණවල මුළු වටිනාකම වූ රු.1,016,703 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි වසරේ මූල්‍ය ප්‍රකාශනවල දැකිවීමට කටයුතු කරනු ලැබේ;. | මූල්‍ය ප්‍රකාශනවල සියලුම ස්ථාවර වත්කම් හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ ගොවිජන සේවා කාරක සභා 05 ක් වෙත ඉකුත් වර්ෂයේ වියදම් වෙනුවෙන් ප්‍රතිපූරණය කර තිබූ රු. 335,035 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වසරවලදී එවැනි වැරදි නිවැරදි කරනු ලැබේ. | වර්ෂයට අදාළ වියදම පමණක් ගිණුම්ගත කර ප්‍රතිපූර්ණය කරගත යුතු ශේෂය ලැබිය යුතු වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 03ක රු. 1,349,542 ක් ආදායම් වැඩියෙන් දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ | වර්ෂයට අදාළ ආදායම් පමණක් අදාළ මූල්‍ය වර්ෂවලදී හෙළිදරව් කිරීමට පියවර ගනු | සමාලෝචිත වර්ෂයට අදාළ නිවැරදි ආදායම ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු |

| | | | |
|---|---|---|---|
| | අතිරික්තය එම ප්‍රමාණ වලින් වැඩියෙන් දක්වා තිබුණි. | ලැබේ. | අතර, අදාළ නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ, ගොවිජන සේවා කාරක සභා 3 ක වාර්ෂික ක්ෂයවීම් එකතුව රු.56,560 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මෙය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | වර්ෂයට අදාළ ක්ෂය වටිනාකම පමණක් හඳුනාගෙ ගිණුම්ගත කළ යුතු අතර, අදාළ නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |
| (ඊ) | ගොවිජන සේවා කාරක සභා 02 කට අදාළ රු.207,754 ක පෙර වර්ෂයේ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණ වලින් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගැලපීම් සිදු කරනු ලැබේ. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂය තුළ ගොවිජන සේවා කාරක සභා 03 ක රු.492,999 ක් වූ ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2025 මූල්‍ය ප්‍රකාශනවල අදාල ගැලපීම් සිදු කරනු ලැබේ. | මූලධන වියදම් හා පුනරාවර්ථන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර, අදාළ නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |

**1.3.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළව ගොවිජන සේවා කාරක සභා 03 ක මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ රු. 56,900 ක ලැබිය යුතු මුදල්, රු.700,000 ක ගෙවිය යුතු මුදල් සහ වටිනාකම දක්වා නැති ට්‍රැක්ටර් රථ 02ක් යන වත්කම් හා වගකීම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවූ බැවින්, විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | ඉදිරියේදී මෙය ලබා ගැනීමට පියවර ගනු ලැබේ. | අදාළ සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 44(1) | අදාළ බල ප්‍රදේශයේ ගොවි සංවිධාන 07ක ගිණුම් වාර්ථා පරීක්ෂා කිරීමට කටයුතු කර | අනාගතයේදී ගිණුම් සුදුසු පරිදි සමාලෝචනය කිරීමට | පනතේ විධිවිධාන ප්‍රකාරව අදාළ ගිණුම් පරීක්ෂා කළ යුතු අතර, එසේ නොකළ |

| | | | | |
|---|---|---|---|---|
| | වගන්තිය | නොතිබුණි. | පියවර ගනු ලැබේ. | නිලධාරීන්ට පියවර ගත යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 6ක මුදල්, චෙක්පත් සහ ගබඩා සම්බන්ධ රාජකාරිවල නිරත නිලධාරීන්ගෙන් අදාල ඇප මුදල් ලබා ගැනීමට පසුගිය වසර 04 තුළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඇප මුදල් ලබා ගැනීමට පියවර ගනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇප තැන්පත් ලබාගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

මුලතිව් දිස්ත්‍රික්කයේ ගොවිජන කාරක සභා 11ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිපලයේ එකතුව රු.3,959,229 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.1,070,006 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල රු.2,889,223 ක ඌනතාවයේ වර්ධනයක් නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 11 හි මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.3,042,604 ක ලැබිය යුතු ගිණුම් සහ රු.13,622,366 ක ගෙවිය යුතු ගිණුම් පසුගිය වර්ෂ 11ක් තිස්සේ නිරවුල් කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අයකර ගැනීමට සහ ගෙවීමට කටයුතු කරමින් පවතී. | ශේෂ නිරවුල් කිරීමට කාලීනව පියවර නොගත් නිලධාරීන්ට පියවර ගත යුතු අතර, ලැබිය යුතු දැ අයකර ගැනීමටත්, ගෙවීමට තිබෙන ශේෂ පියවීමටත් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 3කින් ණය පදනම මත ප්‍රතිලාභීන්ට ලබා දී තිබූ රෝද දෙකේ ට්‍රැක්ටර් සඳහා ලැබිය යුතු රු.1,099,600 ක හිඟ ණය වාරික පසුගිය වසර 11 තුළ අයකිරීමටත්, හිග ණය සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි | හිඟ ණය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | ලැබියයුතු දැ අයකර ගැනීමටත් ගිවිසුම් අනුව කටයුතු කිරීමටත් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු අතර, එසේ කටයුතු කිරීම සිදු නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය. |

**3.2** **නිශ්චිත අරමුණු සඳහා භාවිතා නොකරන ලද මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 07 ක ගොවීන්ගේ සහ සේවකයින්ගේ පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සමත් වූ දරුවන්ට ත්‍යාග ලබා දීම සඳහා විවිධ පාර්ශවයන්ගෙන් රු. 2,081,720ක මුදලක් එකතු කර තිබූ නමුත් පසුගිය වසර 01 සිට 09 දක්වා කාලය තුළ අදාළ මුදල් සුදුසුකම්ලත් සිසුන්ට ත්‍යාග ලබා දීමට භාවිතා කර නොතිබුණි. | ශිෂ්‍යත්ව ලබා දීමට පියවර ගනිමින් පවතී. | අදාළ අරමුදල් විදිමත් අනුමැතිය යටතේ අපේක්ෂිත කාර්යය සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3** **වාහන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 10ට ලබා දී තිබුණු ගොවි උපකරණ 107 ක් පසුගිය වසර 4 සිට 7 දක්වා කාලය තුළ නිෂ්කාර්යයව පැවති අතර ඵලදායීව භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4.** **ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය**

**4.1** **තිරසාර සංවර්ධන අරමුණු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 11ක් විසින් 2017 අංක 19 දරන දරන තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව, තිරසාර සංවර්ධන අරමුණු 2030 වර්ෂයේ ළඟාකර ගැනීම සඳහා ගොවිජන සේවා කාරක සභා විසින් වාර්ෂිකව ඉටුකළ යුතු ඉලක්ක, එම ඉලක්ක ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළයුතු දෑ සහ එහි ප්‍රගතිය මැනීමේ දර්ශක වර්ෂ 07ක සිට හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි. | ක්‍රියාමාර්ග ගනු ලැබේ. | තිරසාර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 11 හි ක්‍රියාකාරකම් මුදල් රෙගුලාසි 133 සහ 134 ප්‍රකාරව අභ්‍යන්තර විගණනයට ලක් කිරීමට ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයා විසින් පසුගිය වසර 11 තුළ කටයුතු කර නොතිබුණි. | ක්‍රියාමාර්ග ගනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු කළ යුතුයි. |

**5. ගොවිජන බැංකු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 5 ක ගොවි බැංකු විසින් පසුගිය වසර 12 ක් තුළ ගොවීන්ට ලබා දී තිබුණු ණය මුදලින් සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.2,334,299 කෘෂිකාර්මික හිඟ ණය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ | කාලීනව ණය අය නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත්, ණය ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර හිඟ ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුතුය. |